මගේ අංකය:- පුත්/මහාධි/ප්‍රසම්පාදන/14/2025

EWIS PERIPHERALS (PVT) LTD.
10 SEP 2025
RE... D

කළමණාකරු,
ඊවිස් පෙරිපෙරල්ස් ආයතනය,
නො.142,
යතාමා ගොඩනැගිල්ල,
ගාලු පාර,
කොළඹ - 03

<u>පෙරනිම් ගොඩනැගිල්ල සඳහා කාර්යාල උපකරණ මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම සම්බන්ධවයි.</u>

පුත්තලම මහාධිකරණ සංකීර්ණයට අයත් පෙරනිම් ගොඩනැගිල්ල සඳහා ඡායා පිටපත් යන්ත්‍ර ( Photo Copier ( Multi drawer ) ) 02 ක් මිලදී ගැනීමට අදාළව මිල ගණන්පත් කැඳවීමට පුත්තලම මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව, මෙ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 01 සිට ඇමුණුම් අංක 06 දක්වා ඇමුණුම් ද අනිවාර්යයෙන් ම සම්පූර්ණ කර ඔබගේ අත්සන හා නිල මුද්‍රාව තබන ලද මිල ගණන් **2025.09.16** වන දින ප.ව.1.30 ට පෙර රෙජිස්ට්‍රාර්, මහාධිකරණය, පුත්තලම යන ලිපිනයට කඩිනමින් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර, මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම්පස "ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කර එවිය යුතුය. (<u>ඔබ ආයතනයේ මිල ගණන් පත්‍රයට අමතරව මේ සමඟ අමුණා ඇති ඇමුණුම් ද අනිවාර්යයෙන්ම සම්පූර්ණ කර ඔබගේ නම, අත්සන හා නිල මුද්‍රාව තබා එවීමට කටයුතු කරන්න</u>.)

04. 2025.09.16 දින ප.ව.1.30 පසුවූ වහාම පුත්තලම මහාධිකරණ විවෘත අධිකරණ ශාලාවේදී අදාළ මිල ගණන් විවෘත කරනු ලබන අතර, ඉන් පසුව ලැබෙන මිල ගණන් භාර ගනු නොලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් විධිමත් ලෙස බලය පැවරූ නියෝජිත මහතෙකුට සහභාගී වීමට පුළුවන. (තැපෑලේදී නැතිවෙන හා ප්‍රමාද වන මිල ගණන් සම්බන්ධයෙන් අප ආයතනය වග කියනු නොලැබේ.)

05. <u>ඔබ ආයතනය විසින් ඉදිරිපත් කරන මිල ගණන් ලංසු විවෘත කරන දිනය වන 2025.09.16 දින සිට දින 2025.10.14 දක්වා වලංගු විය යුතුය</u>. තවද, <u>තෝරාගනු ලබන ආයතනය විසින් අදාළ ඡායා පිටපත් යන්ත්‍ර පුත්තලම මහාධිකරණය වෙත දැනුම් දුන් වහාම කිසිදු ප්‍රමාදයකින් තොරව රැගෙන විත් භාරදීමට කටයුතු කළ යුතුවේ.</u>